සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය -- 2019

## 7 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 02 යි.**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

(1) සිංහල අක්ෂර මාලාවෙහි සඤ්ඤක අක්ෂර සංඛ්‍යාව වන්නේ,

(1) දහයකි. (2) පහකි. (3) හයකි. (4) හතරකි.

(2) මහාප්‍රාණ අක්ෂර පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) ක, ඡ, ඨ, ථ, ඵ (2) ඛ, ජ, ඨ, ථ, ඵ (3) ඛ, ඣ, ඨ, ථ, ඵ (4) ඛ, ඣ, ට, ථ, ඵ

(3) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

(1) විමර්ෂණ, පිළිවෙල, ශිෂ්ඨාචාරය, බනිජ (2) සණ්ටාර, ප්‍රධානියා, අත්‍යවශ්‍ය, නිෂ්පාදන
(3) ප්‍රශ්ණ, සහශ්‍රය, අවශේෂ, පරිඝනකය (4) හදාරණ, පරිශ්‍රය, අනුස්මරණය, ප්‍රවීන

(4) පහත සඳහන් පදවලින් උක්ත පදයක් නොයෙදුණු වරණය වන්නේ,

(1) වෛද්‍යවරු, වැද්දෝ, ගායිකාවක්, උගතෙක් (2) ගුරුවරියක්, ශිෂ්‍යයෙක්, හාමුදුරුවෝ, පියාණෝ
(3) ඇත්තු, සමනල්ලු, පැටව්, මව්පියෝ (4) කුරුල්ලන්, පුතා, දරුවෝ, වෙළෙන්දී

(5) විරුද්ධාර්ථ පද ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) යහගුණ - අවගුණ (2) වේලාව - අවේලාව
(3) සම්මාන - අසමාන (4) නම්බුව - අවනම්බුව

(6) ඉරි ඇඳි පදය අයත් වනුයේ කුමන ක්‍රියා වර්ගයට ද?

නංගී මල් <u>නෙළයි.</u>

(1) මිශ්‍ර ක්‍රියා (2) පූර්ව ක්‍රියා (3) අනවසාන ක්‍රියා (4) අවසාන ක්‍රියා

(7) පහත සඳහන් වාක්‍යාංශය වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

සෙමින් ධාවනය කරන

(1) මන්දගාමී (2) උද්ගාමී (3) සමගාමී (4) අධෝගාමී

- **පහත සඳහන් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(8) නුඹලා දිනපතා දෙමාපියන් නැමද පාසල් ......................................

(1) යන්නේ ය (2) යන්නෝය (3) යන්නෙහු (4) යන්නෙහි

(9) වීරෝදාර සෙබළු රට රැකීමට පෙරට ......................................

(1) ගියෙහු (2) ගියහ (3) ගියෙහි (4) ගියෙමු

(10) තුරුලතා සියලු සතුන්ට සෙවණ ......................................

(1) සදයි (2) සදති (3) සදන්නෝය (4) සදහි

(11) රාජකාරි ලිපියක ඇතුළත් විය යුතු මූලිකාංගවලට අයත් නොවන අංගය වනුයේ,

(1) ලබන්නාගේ ලිපිනය යි. (2) දිනය යි (3) ආශිර්වාදය යි. (4) ආමන්ත්‍රණය යි.

(12) මහ පුදුමෙකි
<u>මලක මලෙකි</u>
මෙහි 'මලක මලෙකි' යනු,

(1) උපමාවකි (2) අනුප්‍රාසවත් යෙදුමකි (3) රූපකයකි (4) එළිසමය යි.

(13) 'හීල් අඩුක්කුව' යනු,

(1) උදේ ආහාරය (2) රාත්‍රී ආහාරය (3) දවල් ආහාරය (4) සීතල ආහාර

(14) 'සේදූරි කරනවා' යනු,

(1) සායම් කරනවා (2) ඉක්මන් කරනවා (3) ගමන් කරනවා (4) ඇති දූඩි කරනවා

(15) පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරන්න.
අරුම පුදුම රටේ ............................................................ පොල් හැටේ.

(1) පදමට (2) පණහට (3) මසුරමට (4) රුපියලට

- **මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් නොදෙන පදය තෝරන්න.**

(16) නෙලුම් - (සිලිලාර, පද්ම, අම්බුජ, සියපත)

(17) රජතුමා - (නරනිඳු, භූපති, නිරිඳු, සුරිඳු)

(18) නිවැරදිව පද බෙදා දක්වා ඇති වාක්‍යය තෝරන්න.

(1) කමත හා වී අතර බුදුන්වහන්සේ ගේ හා දෙවියන් ගේ සම්බන්ධතාවක් ඇතැයි සිංහලයෝ විශ්වාස කරති.
(2) පන්සිය පනස් ජාතක පොත කුරුණෑගල රාජධානි සමයේ ලියන ලද යි සැලකේ.
(3) මව් පිය සැම දෙනා දරුවන් සමඟ රැස්වීමට පැමිණියහ.
(4) 'ලෝවා මහා පාය' යන්නෙහි අර්ථය ලෝහයෙන් තැනූ ගොඩ නැගිල්ල යන්නයි.

- **පහත දක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදය කුමන ක්‍රියා වර්ගයකට අයත්දැයි තෝරන්න.**

(19) මල්ලී කඩදාසියක් <u>නවා</u> ඔරුවක් සෑදුවේය.

(1) ආශිර්වාද ක්‍රියා (2) අවසාන ක්‍රියා (3) පූර්ව ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා

(20) සිත්තරා සිතුවම <u>අඳිමින්</u> වර්ණ ගන්වයි.

(1) පූර්ව ක්‍රියා (2) ආශිර්වාද ක්‍රියා (3) මිශ්‍ර ක්‍රියා (4) අවසාන ක්‍රියා

(ලකුණු 2 × 20 = 40)